Nestlé Good food, Good life

මාධ්‍ය නිවේදනය

13 ජනවාරි 2021, කොළඹ

# නෙස්ලේ සමාගම වයඹ පළාතේ පළමු වාණිජ තෘණමය ගව ආහාර ව්‍යාපාරය සඳහා පහසුකම් සලසමින්, දේශීය කිරි ගොවීන්ට ඉහළ ගුණාත්මක කිරි අස්වැන්නක් වෙනුවෙන් උසස් තත්ත්වයේ සත්ත්ව ආහාර හා ශීතකරණ පහසුකම් සලසාදෙයි

කිරි ගොවීන්ට උසස් තත්ත්වයේ ගව ආහාර (තෘණ) අඛණ්ඩව ලබාගැනීමේ සහ දේශීය කිරි නිෂ්පාදනයේ ගුණාත්මක භාවය හා සැපයුම් වර්ධනය කිරීමේ පියවරක් වශයෙන්, වයඹ පළාත තුළ පළමු තෘණමය ගව ආහාර නිෂ්පාදනය කිරීමේ වාණිජ ව්‍යාපෘතියකට නෙස්ලේ සමාගම පසුගියදා පහසුකම් සැලසුවේය. ඒ අනුව එම ප්‍රදේශයේ ජීවත්වන ගොවි මහතෙකු හා ව්‍යවසායකයෙකු වන ආර්.එම්. පද්මසිරි මහතාට මාසිකව කිලෝ ග්‍රෑම් ලක්ෂයකට අධික තෘණමය ගව ආහාර නිපදවීම සඳහා අවශ්‍ය මූල්‍ය හා තාක්ෂණික පුහුණුව නෙස්ලේ සමාගම පිරිනමයි. බොහෝ ශ්‍රී ලාංකික කිරි ගොවීන්ට වසර පුරා ප්‍රමාණවත් ගව ආහාර සොයා ගැනීමේ විශාල දුෂ්කරතාවක් පවතී. එවන් පසුබිමක පද්මසිරි මහතාගේ නව ව්‍යාපාරය තුළින් ප්‍රදේශවාසී නෙස්ලේ කිරි ගොවීන්ට දැරිය හැකි මිලකට, උසස් තත්ත්වයේ ගව ආහාර අඛණ්ඩව ලබාගැනීමේ හැකියාව උදා වී තිබේ. Market-Oriented Dairy (MOD) ව්‍යාපෘතිය මගින් මෙම වැඩසටහනට අවශ්‍ය තාක්ෂණික උපදෙස් හිමි වේ.

"ශ්‍රී ලංකාව දේශීය කිරිවලින් ස්වයංපෝෂිත වීම කරා ගමන් ගැනීමේදී මෙවැනි වැඩසටහන් ක්‍රියාත්මක වීම අත්‍යවශ්‍යයි. දේශීය කිරි කර්මාන්තයේ සංවර්ධනයට අඛණ්ඩව සහාය දැක්වීම පිළිබඳව මම නෙස්ලේ ආයතනයට ස්තුතිවන්ත වෙනවා", යනුවෙන් වයඹ පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ පළාත් අධ්‍යක්ෂ වෛද්‍ය බී.සී.එස්. පෙරේරා මහතා පැවසීය.

මෙම ව්‍යාපෘතිය එළිදැක්වීමේ අවස්ථාවේදී කිරි ගොවීන්ට කුඩා ශීතකරණ (mini coolers) පිරිනැමීමට ද නෙස්ලේ සමාගම ක්‍රියා කළේය. වෙළෙඳපොළේ පවතින වඩාත් සැහැල්ලු, ජංගම සහ වැඩි ම බලශක්ති කාර්යක්ෂමතාවකින් යුත් මෙම කුඩා ශීතකරණවලට වැය වන්නේ ඉතා ම අඩු විදුලි ප්‍රමාණයකි. එම නිසා කිරි ගොවීන්ට තම කිරි නිෂ්පාදනයේ ගුණාත්මක භාවය මෙන්ම දවසට දෙවරක්, උදේ සහ සවස කිරි ලබාගැනීමෙන් කිරි නිෂ්පාදනය වැඩි කිරීමටත්, සවස රැස් කරන කිරි පසුදින උදෑසන නෙස්ලේ මගින් ලබාගන්නා තෙක් සෙල්සියස් අංශක 4ක ප්‍රශස්ත උෂ්ණත්වයේ තබාගැනීමටත්, මෙම කුඩා ශීතකරණවලින් ලැබෙන්නේ විශාල සහායකි. එසේ දවසට දෙවරක් කිරි ලබාගැනීමට හැකිවීමෙන් කිරි ගොවීන්ගේ ආදායම ද දියුණු වේ.

"දේශීය නිෂ්පාදනය හා ජීවනෝපාය වර්ධනය කිරීම සඳහා දේශීය ප්‍රජාව හා එක්ව සමාගම්වලට කටයුතු කළ හැක්කේ කෙසේද යන්න මෙම වැඩසටහන හරහා හොඳින්

පිළිබිඹු වෙනවා. මෙය, ලාභදායී හා තිරසාර ව්‍යාපාර ගොඩනැංවීම සඳහා දක්ෂම ගොවීන්ට සහාය වන කෘෂි ව්‍යවසායක (agripreneurship) වැඩසටහනට අයත් ව්‍යාපෘතියක්. ඒ වගේම මෙය එම ව්‍යෘපෘතියේ ආරම්භය පමණයි. අප හා එක්ව කටයුතු කරන 14,000ක් වූ ගොවි ජනතාවට වර්ෂ 2021 අවසාන වන විට සාධාරණ මිල ගණන් යටතේ, උසස් තත්ත්වයේ සත්ත්ව ආහාර ලබාගැනීම සඳහා අවශ්‍ය තරම් කෘෂි ව්‍යවසායකයින් බිහිකිරීමට අපි කටයුතු කරන බව පවසන්නේ මහත් ආඩම්බරයෙන් යුතුවයි", යනුවෙන් නෙස්ලේ කළමනාකාර අධ්‍යක්ෂ ෆැබ්රිස් කැවලින් මහතා පැවසීය.

නෙස්ලේ සමාගම යනු ශ්‍රී ලංකාවේ උසස් ප්‍රමිතියේ කිරි මිලදී ගන්නා විශාල සමාගම් අතරින් එකකි. එසේ මිලදී ගන්නා කිරි, මයිලෝ, නෙස්ටමෝල්ට්, නෙස්ප්‍රේ, සහ නෙස්කැෆෙ RTD සහ මිල්ක්මේඩ් වැනි නෙස්ලේ නිෂ්පාදන සඳහා භාවිතා කෙරේ. කිරි කර්මාන්තය සංවර්ධනය කිරීමේ තම වැඩපිළිවෙල යටතේ, කිරි ගොවීන්ට තාක්ෂණික කරුණු හා යහපත් භාවිතාවන් පිළිබඳව නිරන්තර පුහුණු වීම් අවස්ථා ද නෙස්ලේ සමාගම සලසා දෙයි. ඊට සත්ත්ව ආහාර සැපයීම, අභිජනනය, සත්ත්ව සෞඛ්‍ය හා ගොවිපොළ කළමනාකරණය ආදිය අයත් වෙයි. නෙස්ලේ, වටිනා උපකරණ හා ඖෂධ පිරිනමන අතර කිරි ගොවීන්ගේ සංවර්ධනය වෙනුවෙන් මූලාධාර ද රජයේ සහයෝගයෙන් නොමිලේ ජංගම පශු වෛද්‍ය සායන ද සංවිධානය කෙරේ.